# පරිසර අමාත්‍යාංශය

## මල්වතු ද්‍රෝණියේ වනාන්තර, කෘෂිකර්ම සහ සංචාරක අංශයන් වෙත

## ප්‍රජා කේන්ද්‍රීය පරිසර පද්ධති පාදක එළඹුම් ඒකාබද්ධ කිරීම, එක්ව කළමනාකරණය කිරීම ව්‍යාපෘතිය සඳහා විශේෂඥයන් බඳවා ගැනීම

පරිසර අමාත්‍යාංශයේ, ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය විසින් "**මල්වතු ඔය ද්‍රෝණියේ ප්‍රජා කේන්ද්‍රීය පරිසර පද්ධති ප්‍රවේශය තුළින් වනාන්තර, කෘෂිකර්ම සහ සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය**" ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකාවේ උතුරු හා වයඹ පළාත්වල මල්වතු ද්‍රෝණියේ ඒකාබද්ධ භූමි දර්ශන ප්‍රවේශයක් ස්ථාපනය කිරීම තුළින් වනාන්තර, කෘෂිකර්ම සහ සංචාරක ක්ෂේත්‍රවල සැලසුම්කරණය හා ඒවා ක්‍රියාත්මක කිරීම මගින් ජෛව විවිධත්ව සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කරයි.

පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබාදී ඇති විෂය නිර්ණය පත්‍රය (TOR) අනුව පහත සඳහන් විශ්ලේෂණයන් සිදුකර ගැනීම සඳහා සුදුසුකම්ලත් විශේෂඥයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. ආයතනික ශක්‍යතා සහ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීමේ විශේෂඥ (පුහුණු අවශ්‍යතා තක්සේරු) (තනතුරු 01)**

**02. පාර්ශ්වකරුවන් සිතියම් ගත කිරීමේ විශේෂඥ (තනතුරු 01)**

විෂය නිර්ණය පත්‍රය (TOR) 2021 සැප්තැම්බර් මස 13 වන දින සිට 2021 සැප්තැම්බර් මස 27 දින දක්වා පරිසර අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන www.env.gov.lk වෙතින් ලබාගත හැකිය.

### 01. ආයතනික ශක්‍යතා සහ පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීමේ විශේෂඥ (පුහුණු අවශ්‍යතා තක්සේරු) (තනතුරු 01)

ඉහත තනතුරට තෝරාගනු ලබන විශේෂඥයාට පාර්ශ්වකාර ආයතන සඳහා අවශ්‍ය පුහුණු කිරීම් අවශ්‍යතා හා ආයතනික ධාරිතාව හා ශක්‍යතාවයන් හඳුනාගැනීම පිණිස ධාරිතා ශක්‍යතා හා අවශ්‍යතා තක්සේරු කිරීම පිළිබඳ වගකීම අයත් වේ.

ව්‍යාපෘතියේ අරමුණු ජාතික හා ප්‍රාදේශීය සැලසුම් හා උපාය මාර්ගික සැලසුම් සමග ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු හා ධාරිතාවන් හඳුනාගත යුතුය. මෙහි දී සුදුසු උපායමාර්ග හා විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුමක් මෙහිම පසු විපරම් ක්‍රමවේදයක්ද අවශ්‍ය වේ. මේ සඳහා රජයේ සේවාස්ථ පුහුණු හා පූර්ව සේවාස්ථ පුහුණු වැඩසටහන්වල විෂය පථය තුළට ව්‍යාපෘති අරමුණු ඇතුළත්කර යථාවත් කිරීමට අදාළ අවශ්‍යතා හඳුනාගත යුතු ය.

**කොන්ත්‍රාත්තු කාල සීමාව** : මාස 6යි
**අවශ්‍ය පැතිකඩ** : දැනුම/ විශේෂඥතාව

**පොදු**

- ව්‍යාපෘතියට සම්බන්ධ කටයුතු පිළිබඳ දැනුම හා අවබෝධය සහ විශේෂයෙන් උතුරු සහ වයඹ පළාත් වල පාර්ශ්වකරුවන් පිළිබඳ දැනුම හා අවබෝධය.
- පාරදෘෂ්‍යතාවය හා පාලන කටයුතු පිළිබඳ කරුණු කාරණා වලදී මෙන්ම ජෛව විවිධත්වය, කෘෂිකර්මාන්තය, වනාන්තර කළමනාකරණය, සංචාරක කර්මාන්තය හා රාජ්‍ය මූල්‍ය කටයුතු ආශ්‍රිත ගැටලු, යන කරුණු කාරණා සහ ප්‍රවණතා පිළිබඳ මනා අවබෝධය.
- පාර්ශ්වකරුවන්ට, ස්වකීය ධාරිතාව සහ ශක්‍යතාව වැඩිදියුණුකර ගැනීමට අවශ්‍ය උපකරණ හා පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීමේ හැකියාව

**විශේෂිත**

- උතුරු හා වයඹ පළාත්වල වනාන්තර, කෘෂිකර්ම සහ සංචාරක යන අංශවලට ප්‍රජා කේන්ද්‍රීය පරිසර පද්ධති ප්‍රවේශය අන්තර් ග්‍රහණය කර ගැනීම පිළිබඳ මනා අවබෝධය.
- වර්තමාන ශක්‍යතාවයන් පිළිබඳ විශ්ලේෂණයන් සිදුකරගැනීමේ හැකියාව .(උපකරණ හා මානව අවශ්‍යතා)
- ආයතන ශක්‍යතා/ ධාරිතා අවශ්‍යතාවලට අදාළ නීතිමය ආයතනික රාමු සඳහා විවිධ අංශවල ප්‍රමුඛතා ක්ෂේත්‍ර සහ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම.
- ස්වකීය ශක්‍යතාවයන් වැඩිදියුණු කර ගැනීම සඳහා, පාර්ශ්වකරුවන් හට අවශ්‍ය වන, පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම.
- "**ඒකාබද්ධ කළමනාකරණ**" ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වනාන්තර, කෘෂිකර්ම සහ සංචාරක ක්ෂේත්‍රයන් තුළට ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය වන ශක්‍යතා වර්ධනය කිරීමට අදාළ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- පුහුණු ආයතන හා සමීපව කටයුතු කරමින්, මල්වතු ද්‍රෝණියේ වනාන්තර, කෘෂිකර්ම සහ සංචාරක අංශයන් වෙතට, ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවාහගත කිරීම සඳහා සුදුසු පුහුණු මොඩියුල හා දැනුම ලබාදීමට අවශ්‍ය මෙවලම් සැකසීම.
- ඔවුන් හා සමග සමීපව සාකච්ජා කරමින් හඳුනාගත් පුහුණු කිරීමේ ආයතනවල දැනට පවතින මොඩියුල යාවත්කාලීන කිරීම.
- කෘෂිකර්මය, සංචාරක ක්ෂේත්‍රය හා වනාන්තර අංශවල, අධ්‍යාපන පුහුණු කිරීම්, ශක්‍යතා අවශ්‍යතා සහ මහජන දැනුවත්වීම් අංශවල අවශ්‍යතා සහ හිඩැස් සමාලෝචනය කිරීම හා විශ්ලේෂණය කිරීම.

**අධ්‍යාපනය / පළපුරුද්ද**

- අදාළ විද්‍යාවේදී හෝ ශාස්ත්‍රවේදී උපාධියක් හෝ ඊට ඉහළ සුදුසුකමක්
- සමාන කාර්යයක, වසර 10කට වැඩි සේවාස්ථ පළපුරුද්ද
- ලිඛිත, වාචික, සංවිධානමය, විශ්ලේෂණමය හා අන්තර් පුද්ගල කුසලතා ඉහළ මට්ටමක තිබීම
- බහුවිධ සංස්කෘතිකමය පසුබිමක වැඩ කිරීමේ පළපුරුද්ද
- විශිෂ්ට භාෂාමය ප්‍රවීණතාවය හා මෘදුකාංග පිළිබඳ කුසලතාවය
- වාර්තා ලිවීම හා සමාලෝචනය, ඉදිරිපත් කිරීම සහ නිර්දේශ තහවුරු කිරීම වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳ දක්ෂතාවය

### 02. පාර්ශ්වකරුවන් සිතියම්ගත කිරීම සඳහා විශේෂඥ (01)

පරිසර අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවේ වයඹ හා උතුරු පළාත්වල පිහිටා ඇති මල්වතු ඔය ද්‍රෝණියේ ජෛව විවිධත්වය සංරක්ෂණය හා වනාන්තර, කෘෂිකර්මය සහ සංචාරක යන අංශවලට අදාළව තිරසාර භාවිතයන් පිළිබඳ අදාළ සියලු පාර්ශ්වකරුවන් (රජය, ප්‍රජා මූල්‍ය සංවිධාන, පෞද්ගලික අංශය, දේශීය රාජ්‍ය නොවන සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන) හඳුනා ගැනීම සහ පූර්ණ අධ්‍යයනයක් සඳහා විශේෂඥවරයෙකු යොදවා ගැනීමට බලාපොරොත්තු වේ. පාර්ශ්වකරුවන් හඳුනා ගැනීමේදී, ව්‍යාපෘති අරමුණු සපුරා ගැනීම සඳහා වන දීර්ඝ කාලීන ඒකාබද්ධ භූමි දර්ශන සැලසුම්කරණය හා ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය අවකාශය සලසා දීම සඳහා උපකාරී වන තොරතුරු ලබා දීමද අපේක්ෂා කෙරේ.

**කොන්ත්‍රාත් කාල සීමාව** : මාස 4 කි
**අවශ්‍ය පැතිකඩ** : දැනුම / විශේෂඥතාව

**පොදු**

- ව්‍යාපෘතියට අදාළ කටයුතු පිළිබඳව සහ පාර්ශවකරුවන් (විශේෂයෙන් උතුරු හා වයඹ පළාත්වල) පිළිබඳව දැනුම සහ අවබෝධය
- ව්‍යාපෘති භූමි දර්ශන වල ක්‍රියාත්මක කරනු ලබන අදාළ ක්ෂේත්‍ර වලට අදාළ වන මැදිහත්වීම් සොයා බැලීම සහ සියලුම පාර්ශ්වකරුවන් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සිදු කිරීමේ හැකියාව.
- විනිවිදභාවය සහ පාලනය පිළිබඳ ගැටලු, කරුණු කාරණා මෙන්ම රාජ්‍ය මූල්‍ය කටයුතු හා ජෛව විවිධත්වය, කෘෂිකර්මය, වනාන්තර සහ සංචාරක කටයුතු පිළිබඳ ප්‍රවණතා, ගැටලු සහ ගතිකත්වයන් පිළිබඳ පෘථුල අවබෝධය.
- රජයේ ප්‍රතිපත්ති හා ව්‍යුහයන් පිළිබඳ මනා දැනුම.

**විශේෂිත**

- උතුරු හා වයඹ පළාත්වල, වනාන්තර, කෘෂිකර්ම සහ සංචාරක අංශවලට, ප්‍රජා කේන්ද්‍රීය පරිසර පද්ධති ප්‍රවේශය ඒකාබද්ධ කිරීමේ මනා අවබෝධය.
- වනාන්තර, කෘෂිකර්මය සහ සංචාරක යන අංශවල ආංශික තීරණ ගැනීමේ සහ ඉඩම් පරිහරණ සැලසුම්කරණය තුළට සංරක්ෂණ හා තිරසර භාවිත ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමේදී ධනාත්මකව හා සෘණාත්මකව බලපාන සියලුම ප්‍රධාන සිවිල් සමාජීය පාර්ශ්වකරුවන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශවකරුවන් හඳුනාගැනීමේ හැකියාව.
- පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන්, ඉලක්කයන් හා අරමුණු පැහැදිලි කර ගැනීම සහ ඒවා ඔවුන්ගේ අභිලාෂයන් පාදක කරගෙන වර්ගීකරණය කිරීම.
- ඒකාබද්ධ කළමනාකරණය කිරීම යන සංකල්පයට බාධා පමුණුවන, ප්‍රතිපත්ති හා රෙගුලාසි වල අඩුපාඩු හා දුර්වලතා හඳුනාගැනීම.
- විවිධ පාර්ශ්වකරුවන්ගේ භූගෝලීය ක්‍රියාකාරකම් සිතියම්ගත කිරීම සහ වර්තමාන සහ ඊළඟ වර්ෂ හතර (4) සඳහා අනුමත කළ හෝ සැලසුම්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන ඇතුළත් කිරීම.
- දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය මට්ටමේ ආයතනද ඇතුළුව රජයේ දෙපාර්තමේන්තු සහ ඊට අදාළ සැලසුම් මෙන්ම එම ආයතනවල දයකත්වය හා ඔවුනගේ අවශ්‍යතා කවරේද යන්න දැක්වීම.
- විවිධ පාර්ශ්වකරුවන් අතර ඇති සම්බන්ධතාවයන් ගවේෂණය කිරීම.

**අධ්‍යාපනය / පළපුරුද්ද**

- අදාළ විද්‍යාවේදී හෝ ශ්‍රාස්ත්‍රවේදී උපාධියක් හෝ ඊට ඉහළ සුදුසුකමක්
- මීට සමාන කාර්යයන් පිළිබඳ වසර 10 කට වැඩි සේවා පළපුරුද්ද
- බහුවිධ සංස්කෘතික පරිසරයක කටයුතු කිරීමේ පළපුරුද්ද
- ඉංග්‍රීසි හා සිංහල භාෂා මනා ලෙස ලිවීමේ හා කතා කිරීමේ හැකියාව (දෙමළ භාෂා ප්‍රවීණතාවය ඇත්තම් අමතර සුදුසුකමක් වනු ඇත)
- වාර්තා හා සමාලෝචන ලිවීමේ, ඉදිරිපත් කිරීමේ සහ නිර්දේශ තහවුරු කිරීම වෙනුවෙන් පෙනී සිටීමේ හැකියාව

අපේක්ෂිත අයදුම්කරුවන් හට අධ්‍යක්ෂක, ජෛව විවිධත්ව අංශය, පරිසර අමාත්‍යාංශය, සොබාදම් පියස, 416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල යන ලිපිනයෙන්, biodiversitysl@gmail.com යන විද්‍යුත් තැපෑලෙන් සහ 0112034208 යන දුරකථන අංකයෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

### අයදුම්පත් යොමුකිරීම

අපේක්ෂිත විශේෂඥයින් තම ජීව දත්ත පත්‍රිකාව සහ අදාළ සුදුසුකම් සනාථ කිරීමේ සහතිකවල ඡායා පිටපත් සමග **2021 සැප්තැම්බර් 27** වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට එවිය යුතු අතර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුයි. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන අතර තෝරාගැනීමේ ක්‍රියාවලියේ අවසන් තීරණය පරිසර අමාත්‍යාංශය සතුවේ.

**ලිපිනය :**
**අධ්‍යක්ෂක,**
**ජෛවවිවිධත්ව අංශය,**
**පරිසර අමාත්‍යාංශය, සොබාදම් පියස,**
**416/C/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල.**